# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,841 - 2013 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා - 2013.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 3420 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 3420 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 03 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 දෙසැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


3419- B 80793— 3,400 (2013/12)
F 1 -

# පළාත් සභා නිවේදන

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

### විනෝද බද්ද

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ දෙසැම්බර් මස 06 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 7-1 යටතේ සභා සම්මත කරනු ලැබූ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාවට, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 267 වන අධිකාරය වන විනෝද බදු ආඥා පනතේ 02 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර අමාත්‍ය ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන ම විසින් අනුමැතිය දෙන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන අමාත්‍ය,
දකුණු පළාතේ පළාත් සභාව.

2013 ඔක්තෝබර් මස 02 වැනි දින,
ගාල්ල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### යෝජනාව

,"267 වැනි අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ කාර්යය සඳහා වන කිසියම් විනෝද කටයුත්තක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුකරන සෑම තැනැත්තෙකු විසින් ම එම විනෝද කටයුත්ත,

(අ) සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට හතක (7%) ක ප්‍රමාණයට සමාන මුදලක් ද, සහ

(ආ) වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අයකරගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක ප්‍රමාණයට සමාන මුදලක් ද,

ඉහත කී විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර විනෝද බද්ද වශයෙන් පනවා අයකර ගත යුතු බවත්, එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර එකී විනෝද බද්ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-570/2

# අතුරු ව්‍යවස්ථා

## ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 දිනැති ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශ තුළ සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සියලුම සම්මත අතුරු ව්‍යවස්ථාවලට ම අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සභා රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සිසිල් බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා, හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධාකිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පොදු වෙළෙඳපොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා දකුණු පළාතේ, පළාත් සභාව විසින් 2013.07.23 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී ඒකමතිකව ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රමසම්පාදන
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා
ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
ගාල්ල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

12-570/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.